# අති නවීන සහ විශේෂිත පහසුකම් සහිත හේමාස් රෝහල විවෘත වේ

***2008 දෙසැම්බර් 6 කොළඹදී:*** අති නවීන තාක්ෂණයෙන් යුත්, බහු විශේෂිත, ඇඳන් 100 කින් සමන්විත වත්තල ඉදිකළ හේමාස් රෝහල නිල වශයෙන් විවෘත කිරීම සෞඛ්‍ය සහ පෝෂණ අමාත්‍ය මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) විධායක මණ්ඩලයේ ගරු සභාපති නිමල් සිරිපාලද සිල්වා මැතිතුමා අතින් අද සිදුවිය.

"අපි ආඩම්බර වෙනවා, ආසියාවේ කීර්තිමත් ලෙස රෝහල් ව්‍යාපාරයේ යෙදෙන කොලොම්බියා ඒෂියා හොස්පිට්ල්ස් දමය සමග එක්ව සැබැවින්ම තාක්ෂණයෙන් උසස් මේ රෝහල ආරම්භ කිරීමට අවස්ථාව ලැබීම ගැන. අපේ කීර්තිමත් ශ්‍රී ලාංකික වෛද්‍යවරු සහ පුහුණු හෙද කාර්ය මණ්ඩලයක් සමග රෝගීන් කේන්ද්‍ර වූ, වියදමට සරිලන, උසස් ගුණාත්මක බවින් යුත් සෞඛ්‍ය සේවාවක්ද සහිත අංග සම්පූර්ණ සේවාවන් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රජාව වෙත සැපයීමට අපි සියළු අතින්ම සූදනමින් සිටිනවා." හේමාස් රෝහලේ සභාපති මුර්තසා එසුෆලි මහතා පැවසීය.

මෙහි සැපයෙන පුළුල් පරාසයක සේවාවන් අතර වායු ගලන මෙහෙයුම් සහිත අති නවීන පහසුකම් වලින් යුත් ශල්‍යාගාර (ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට කරන ලද සවි කිරීමකි), අසාධ්‍ය රෝගීන් සඳහා ඇඳන් 10 කින් සමන්විත නවින පහසුකම් වලින් යුත් දැඩි සත්කාර ඒකකයක්, පෞද්ගලික සූතිකාගාර සහ නවීනතම පහසුකම් වලින් යුත් නොමේරූ ළදරු ඒකක (NICU), චැනල් උපදේශන පහසුකම් සහ රෝග පරීක්ෂාවන්, ව්‍යායාම් ඊ.සී.ජී සහ එකෝ කාඩියෝග්‍රැෆි සහිත හෘද රෝග සේවා, උසස් තාක්‍ෂණික පහසුකම් සහිත අක්ෂි ශල්‍ය ඒකකයක්, දන්ත ශල්‍යාගාර පහසුකම්, MRI ස්කෑන් (ශ්‍රී ලංකාවේ ප්‍රථම විවෘත චුම්බක MRI ස්කෑන් යන්ත්‍රය) සී.ටී සහ Ultra Sound ස්කෑන්, එක්ස් කිරණ, රෝග නිරීක්ෂණ එන්ඩොස්කොපි සහ ලැපරොස්කොපික් සැත්කම්, 24 පැයේම ක්‍රියාත්මක හදිසි ප්‍රතිකාර ඒකකයක් ස්වයංක්‍රීය කරණයෙන් යුත් පරීක්ෂණාගාරයක්, 24 පැයේම ක්‍රියාත්මක බාහිර රෝගී අංශයක්ද වේ.

නවතම ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් සහතික වන ආකාරයෙන් ඉදිකොට ඇති හේමාස් වත්තල රෝහල එහි ගොඩනැගිලි සැලැස්ම සැකසීමේදී සහ ආසාදන වැළැක්වීමේ ප්‍රතිපත්ති වලදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන් දැඩි ලෙස පිළිපැදීමට වග බලාගෙන තිබේ. තම පරීක්ෂණාගාරවල තත්ත්වය සහතික කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගැනෙන තත්ත්ව සහතික ක්‍රමයන් යොදාගෙන ඇති හේමාස් රෝහල එහි මෙහෙයුම් සඳහා යොදගැනෙන ජාත්‍යන්තරව භාවිතා වන තොරතුරු තාක්ෂණ ජාලය ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි වෙනස්කොට සකසා ඇත. එසේම රෝහලේ පෝෂණ වේදයට අනුව ආහාර සැකසීමේදී සහ රෝගීන් රැකබලා ගැනීමේදී බ්‍රිතාන්‍ය ප්‍රමිතීන් අනුගමනය කරනු ලබයි. ස්වාධින වෛද්‍ය විශේෂඥයින් පිරිසකගෙන් සමන්විත ඖෂධ සහ චිකිත්සක කමිටුවක් මගින් රෝගීන් සඳහා දැරිය හැකි ලෙස සහ ගුණාත්මක බවින් යුතු ඖෂධ සැපයීම පිළිබඳවද සහතික කෙරේ.

ළදරු චිකිත්සාවේ සිට වෘද්ධ චිකිත්සාව දක්වා මුළු පවුලටම අවශ්‍ය සියලුම වෛද්‍ය අවශ්‍යතාවයන් ඉටු කරන හේමාස් වත්තල රෝහල පවුලේ රෝහලක ස්වරූපයෙන් යුක්ත වන අතර එහි බාහිර රෝගී අංශය තුල ළමා උද්‍යානයක්ද ඉදිකොට ඇත. මේ අනුව සියළුම පහසුකම් එකම වහලක් යටදී ලබාගැනීමට අවස්ථාව උදා වේ. වායුසමනයෙන් සහ විශාල ඉඩ පහසුකම් වලින් යුතු නැවතීමේ ශාලාවෙන් සහ කාටුන් සිට ප්‍රවෘත්ති දක්වා රූපවාහිනී වැඩසටහන් නැරඹිය හැකි කේබල් රූපවාහිනී සේවා සහිත සුවපහසු කාමරවලින් රෝගී හිතකාමී පරිසරය තව තවත් වැඩි වේ. එහි 100% ක් වන ශ්‍රී ලාංකික සහ මිත්‍රශීලී කාර්ය මණ්ඩලය නේවාසික රෝගීන්ට උපරිම පහසුකම් සැලසීම සඳහා මනා ලෙස පුහුණු කොට තිබේ.

රුපියල් මිලියන 1500 වියදමින් තනා පසුගිය අගෝස්තුවේදී නිල නොවන ලෙස විවෘත කළ රෝහල මේ වන විට නේවාසික සහ බාහිර රෝගීන් 10,000 කට ප්‍රතිකාර ලබාදී තිබේ.

තම රෝගීන්ට නව ප්‍රමිතියෙන් යුත් වෛද්‍ය රැකවරණයක් ලබාදීම සඳහා කැපවීමෙන් කටයුතු කරන හේමාස් රෝහල්වල ආරම්භය සෞඛ්‍ය සේවා කර්මාන්තය වෙත එහි ප්‍රවේශ වීම සනිටුහන් කරයි. මෙම රෝහල් ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි මාස 18 කින් නිමාවට පත් විය. ICC සමාගම විසින් ඉදිකිරීම් කරනු ලැබූ අතර වාස්තු විද්‍යාඥයින් සහ කළමණාකරු ලෙස කටයුතු කළේ රුක්ෂාන් විද්‍යාලංකාර ඇසෝසියේට්ස් ආයතනයයි.

හේමාස් සමූහය රෝහලේ ප්‍රධාන ආයෝජකයා සහ කළමණාකරු ලෙස කටයුතු කරනු ඇත. එහි උපාය මාර්ගික ආයෝජකයින් ලෙස කොලොම්බියා ඒෂියා (ජාත්‍යන්තර රෝහල් දමයකි), බ්‍රැන්ඩික්ස්, MJF හොල්ඩිංග්ස් සහ අනෙකුත් ඉහළ පෙළේ ජාත්‍යන්තර ආයෝජකයින් කීපදෙනෙකු ද කටයුතු කරයි.

හේමාස් රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය හුසේන් එසුෆාලි (විධායක නොවන අධ්‍යක්ෂ), මූර්තසා එසුෆාලි (සභාපති ) රිචර්ඩ්ස් එෆ්. එවන්ස් (විධායක නොවන අධ්‍යක්ෂ සහ සභාපති කොලොම්බියා ඒෂියා සමූහ සමාගම), ප්‍රේම් ඒබ්‍රහම් (සමූහ මූල්‍ය අධ්‍යක්ෂ කොලොම්බියා ඒෂියා සමූහ සමාගම), ලීනස් ජෙගනාදන් (අධ්‍යක්ෂ - මූල්‍ය), වෛද්‍ය අරුණ රබෙල් (අධ්‍යක්ෂ වෛද්‍ය සේවා) සහ ආනන්ද විමලසේන (විධායක නොවන අධ්‍යක්ෂ) යන අයගෙන් සමන්විතය.

හේමාස් හෝල්ඩින්ග්ස් සමාගම ප්‍රධාන ක්ෂේත්‍ර 5ක් ඉලක්ක කොටගත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ සමූහ ව්‍යාපාරයකි. ඒ පාරිභෝගික, සෞඛ්‍ය, ප්‍රවාහනය, සංචාරක සහ නව ආයෝජන යනාදියය.

**Media Contact :**
Dr. Aruna Rabel, Director Medical Services, Hemas Hospital Wattala – 077 374 5880
Murtaza Esufally - Chairman Hemas Hospitals and Director Hemas Holdings Plc - 0777 363 066
Kumar / Tharindra de Silva – Adahas PR - 0777 379 973, 0777 560 611